# මිහින්තලාවේ අරලිය හෙවනේ

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයේ පුස්තකාලයාධිපති
ප්‍රේමචන්ද්‍ර මාගම්මන

රත් පැහැ වැටෙන විට ගන නිල් ගුවන් ත ලේ
සෑ හිමි රුව ඇඳෙයි නිල්වන් සලිල ත ලේ
නුවර වැවේ කිමිදී ගිය වැව් පතු ලේ
රත් කොත සැලෙයි ළය මානෙට දිය රැල් ලේ

රත් ගිරි පා අසල සීතල අඹ වන යේ
නැග එයි කොවුල් ගී රාවය වසන්ත යේ
මී අඹ මල් පොකුරු සෙලවෙන හිමිදිරි යේ
පැතිස් නරනිඳුගෙ කිරුලෙහි පැහැය ගෙ නේ

ලා තණ පත් සොයා දිව යන මුව පොවුව න්
නිදා සිටින විට තුරු යට තණ පලසි න්
සිරුරෙහි ඇඳුණු තිත් පෙල මල් පෙති විලසි න්
රවටයි ගිරි හිසින් පියඹන සමනලය න්

මඳ පවනෙහි සැලී ගිලිහී යන නටුවෙ න්
මුවරඳ සුවඳ විහිදෙන අරලිය කුසුම් න්
පිය ගැට පෙළ වැසුණු පලබර තුරු අතරි න්
මලසුන් වැන්න නිමකළ කිරි ගරුඬ ගලි න්

ගල්ලෙන් අසල ගිරි මුදුනේ පොකුණු තෙරි න්
බබලන වළා කැටි ලෙස අරුණළු කිරණි න්
දරමින් කසාවත් සං සුං පා ගමනි න්
පූරවයි මහ වනය පිරිසුදු සිල් සුවඳි න්

රඳවා දෝත මත රතුපුල් මල් බඳු න
සුදු ඔසරියෙන් සැරසී පියකරු ලෙසි න
වසා උපුල් පෙති වැනි අඬවන් නය න
පෙන්වයි ලඳුන් නාලිය පරදන ගම න

නවතා කොවුල් ගී ඉද අඹ ගස් අස් සේ
සන්ටාරයේ හඬ නැග එන පවුව සී සේ
අසමින් තුරු මඩුලු මත නිදි-ගත් විල සේ
සමවත් සුව විඳින මෙනි නිසසල පෙදෙ සේ

අනු බුදු හිමි පහස ලද රත් ගිරි බෙයෙ ද
අසලින් නැගි සෙවන දෙන තුරු පෙලක් මැ ද
අබි දම් මෙනෙහි කර සැතපුණු පහන් ඇ ද
සුරැකිව තිබේ තවමත් ගල් කුටිය මැ ද

රත් වැලි සෑ රදුගෙ සිරුරට මුවා වෙමි න්
ටික ටික බසින හිරු මඬලේ රඹ පාටි න්
නුවර වැවේ පෙරලෙන දිය රැළි නගමි න්
ඈත පෙනේ ඇතිරූ රත් සළු විලසි න්

නැග එන පොසොන් සඳ පෙරදිග ගුවන් ගැබි ත්
මිස්සක පවුව නහවන විට කිරි දියරි ත්
බැස යන හිරුගෙ රන්වන් පැහැ මුසුවීමෙ ත්
පෙනෙයි වළා මත නැගි සුර විමන ලෙසි ත්

රන් කොත වසා ඔබ්බා ඇති සුනිල් මීණෙ ත්
නික්මෙන සොමි කිරණ බොල් පිණි කැට සමගි ත්
මුසුවුණු අමා කැන් නිලඹර වසා යමි ත්
සවණක් රැස් ගලයි මහ සෑ රදුගෙ හිසි ත්

කුමුදු මල් සුවඳ ගෙන කළු දිය පොකුණි ත්
සිතාරයක තත් බිඳිනා මියුරු හඬි ත්
බෝපත් සැලෙන විට සීතල මද පවනි ත්
ලොවුතුරු සුවඳ විහිදෙයි මිස්සක පවුවෙ ත්

තාජ දුර්ජන සංසර්ගං
භජ සාධු සමාගමම්
කුරු පුණ්‍ය මහෝ රාත්‍රම්
ස්මර නිත්‍ය මනිත්‍යතාම්

දුර්ජන ඇසුර අත් හරින්න
සත් පුරුෂයන් ඇසුරු කරන්න
දිවා රාත්‍රී කුසල් කරන්න
නිතරම අනිත්‍යතාවය මෙනෙහි කරන්න

දුර්ජනෙන සමං වෛරං
සඛං චා'පි න කාරයේත්
උෂ්ණෙ දහති චාංගාර
ශීතඃ කෘෂ්ණායතෙ කරම්

දුදන සහ වෛර හෝ
මිතුරු බව නොකරන්නේ
උණු අඟුරු අත දවනේ
නිවුණේ දෑලි තවරනේ

ඡන්නමති වස්සති - විවටං නාති වස්සති
තස්මා ඡන්නං විවරෙථ - එවං නාති වස්සති

වරද සැඟවීමෙන් වරද වැඩිවෙයි
වරද හෙළි කිරීමෙන් වරද වැඩි නොවේ
එනිසා සැඟවී තිබෙන වැරදි හෙළි කරව්
එසේ කිරීමෙන් වරද වැඩි නොවේ
( චූල්ලවග්ග )